# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම 2024
## සිංහල භාෂාව හා සාහිත්‍යය
## 7 ශ්‍රේණිය

Learning Resource Center
R
De Mazenod College
Kandana
2024-08.

**කාලය පැය 02 යි** | **විභාග අංකය/නම ..............................**

**සැලකිය යුතුයි.**

- පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- i හා ii පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

### I කොටස

❖ **පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. නංගී සමග අමනාප වූ දැහැමි **කරබාගෙන** පිටව ගියා ය.
1) ලජ්ජාවෙන් 2) නිශ්ශබ්දව 3) බැණ බැණ 4) නැවිලා

02. සුගතන් සීයා තාත්තා ළඟට පැමිණියේ **අතමාරුවක්** කර ගැනීමට ය.
1) ණයක් ලබා ගැනීමට 2) උදව්වක් ගැනීමට
3) ණය මුදලක් දෙන්නට 4) පණිවිඩයක් කීමට

❖ **ප්‍රශ්න අංක 03 සිට 04 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය තෝරන්න.**

03. මෙරට කතෝලික සංස්කෘතිය කිතු දහමේ හා සිංහල සංස්කෘතියේ............ විය යුතු බව එතුමා පැවසීය.
1) කොටසක් 2) ආදර්ශයක් 3) පාලනයක් 4) සංකලනයක්

04. සමන් දෙවි රුවෙහි හා දෙවියන් සතුව ඇතැයි කියන ............ බලය පිළිබඳ විශ්වාසයක් ඇත.
1) ගාම්භීර 2) තේජෝ 3) ගුප්ත 4) පූර්ණ

❖ **සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.**

05. 1) කණ්ඨජ, ශිෂ්ටාචාරය, දුෂ්ට, සමස්ත 2) විශේෂණ, ප්‍රස්ථාර, ශිඛර, නිශ්චල
3) විශිෂ්ඨ, දුශ්ශීල, පශ්චාත්, මාලිග ාව 4) නිශ්චල, සාන්ථාර, ලේඛන, පාෂාණ

❖ **සඤ්ඤක අක්ෂරයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය වන්නේ,**

06. 1) ගිඳිනුනොද, වළඳ, අඩහැරය, විහඟ 2) කඳ, දොඹ, කොඳකැකුළු, කොළඹ
3) ඇඹුල, බොළඳ, ඥානය, සුවඳ 4) පඹයා, ඇඳුන්ත, නුඹ, මලිඳු

❖ **උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.**

07. 1) ගුරුවරියක, හෙදියක, මීයෙකු, ළමයෙක් 2) එළදෙනෙක්, වෛද්‍යවරු, නිළියක, ගිරවෙකු
3) පූසෝ, භික්ෂුව, ගිරවු, සෙබළ් 4) අප, මා, ඔවුන්, මම

08. **මධ්‍යම පුරුෂ බහුවචන ආඛ්‍යාතයක් වන්නේ,**
1) කරන්නෙහි. 2) කියවහු. 3) කියවන්නෙමි. 4) කියවති.

❖ ප්‍රශ්න අංක 09 හා 10 සඳහන් හිස්තැනට සුදුසු පදය තෝරන්න.

09. සංගීත විශාරදයෝ ගී තනු නිර්මාණය ............
1) කරයි. 2) කළා ය. 3) කළේ ය. 4) කළහ.

10. පාලකයා කම්කරුවන් සේවයේ ............
1) යෙදෙව්වෙමි. 2) යෙදෙව්වෙමු. 3) යෙදෙව්වේ ය. 4) යොදවති.

11. පහත සඳහන් පදයේ ඇති පිල්ලම් පිළිවෙළින් යෙදී ඇති පිළිතුර වන්නේ,

කුරුමානම

1) පාපිල්ල, ඇදය, ඇලපිල්ල
2) කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල
3) දීර්ඝ පාපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල
4) කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය

12. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන පිළිතුර වන්නේ,
1) සාර්ථක - සතුටු
2) අභ්‍යන්තර - බාහිර
3) යහගුණ - අවගුණ
4) අවමාන - සම්මාන

13. සමානාර්ථවත් පද යුගලය සහිත පිළිතුර වන්නේ,
1) කීර්තිය - අයස
2) දත් - චූර්ණ
3) අහස - සිඳු
4) ප්‍රවීණ - නිපුණ

14. පහත සඳහන් වැකියේ ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

රජතුමා චරපුරුෂයන්ට අවවාද <u>කර</u> නිදහස් <u>කරමින්</u> රටින් පිටුවහල් <u>කළේ ය.</u>

1) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියාව
2) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියාව
4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියාව

15. උපසර්ග පදයක් යෙදී නොමැති පිළිතුර වන්නේ.
1) අභිමානය 2) නිවහල් 3) කරන්න 4) දුසිරිත්

16. පහත සඳහන් කවියේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

කෙන්ද පොල් ඉතා
.................................
කඹය ඉන් ගොතා
ගෙන බැන්ද හැකි ඇතා

1) තව නොමැත ගොතා
2) ගසක එය ඇතා
3) බලමු එය ගොතා
4) සුළු දෙයකි සැක නැතා

17. පහත සඳහන් වැකියේ නාම විශේෂණ පදය හා ක්‍රියා විශේෂණ පදය ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,

කාලයකින් දුටු මවගේ සුවඳ පිරුණු සතුටු මුහුණ දැක ඇය සෙනහසින් සිනාසුණා ය.

1) සතුටු - සෙනෙහසින්
2) සුවඳ - පිරුණු
3) ඇය - සෙනෙහසින්
4) මුහුණ - සිනාසුණා ය

18. පහත සඳහන් කවියේ ඉරි ඇඳි පදයන්ට අදාළ අලංකාරයක් වන්නේ,

නෙළුම් කොළයේ නොම ඇළි
දිය බිඳුවක ගැලි ගැලි
පෙරළි පෙරළි සෙල්ලම් කොට
දිය රැල්ලට එක්වෙලා

1) රූපයකි. 2) විරිතකි. 3) අනුප්‍රාසයකි. 4) තාලයකි.

19. පහත සඳහන් වාක්‍යාංශයට ගැළපෙන තනි පදය ඇතුළත් පිළිතුර වන්නේ,

නියම ස්වරූපය සැඟවී පවතින

1) අනියම 2) ගුප්ත 3) රහස 4) බොරුව

20. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර වන්නේ,

1) "මනඃකල්පිත " යන වචනයේ ඇතුළත් වන්නේ අනුස්වාරයයි.
2) සිදත් සඟරාව ලියැවී ඇත්තේ අදින් වසර 8000 කට පෙර ය.
3) හෝඩියේ සඳහන් "ෆ" සංකේතය සංස්කෘත භාෂාවෙන් උපුටා ගන්නා ලදි.
4) සඤ්ඤක අක්ෂර සිංහල භාෂාවට ම අනන්‍ය වූ අක්ෂර විශේෂයකි.

(මුළු ලකුණු 2×20=40)

## II කොටස

- 01 සහ 02 ප්‍රශ්න අනිවාර්ය වේ.
- 03-04-05-06-07 ප්‍රශ්නවලින් ප්‍රශ්න තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. පන්ති කාමරයේ දී ක්ෂේත්‍ර ක්‍රියාකාරකමක් ලෙස ඔබ සකස් කළ ජනකතා පිළිබඳ පොත් පිංච ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) පොත් පිංච සඳහා ඔබ යෙදූ නම කුමක් ද? (ල. 02)
(ii) පොත් පිංච නිර්මාණයේ දී ඇතුළත් කළ ජනකතා තුනක නම් ලියන්න. (ල. 03)
(iii) පොත් පිංච නිර්මාණය කිරීමේ දී ගුරුතුමා ලබා දුන් උපදෙස් තුනක් ලියන්න. (ල. 03)
(iv) මෙය නිර්මාණය කිරීමට තොරතුරු සොයා ගත් මූලාශ්‍ර තුනක් ලියන්න. (ල. 03)
(v) මෙම පොත් පිංච නිර්මාණය කිරීමේ දී ඔබට මතු වූ ගැටලු තුනක් ලියන්න. (ල. 03)
(vi) මෙම පොත් පිංච නිර්මාණය කිරීමෙන් ඔබ ලැබූ වාසි දෙකක් ලියන්න. (ල. 02)

(මුළු ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ට නොඅඩුවන සේ රචනයක් ලියන්න.

(i) වැලිවිට සරණංකර හිමියෝ
(ii) මා සිත් ගත් කතුවරයා
(iii) කමතක අසිරිය දුටුවෙමි
(iv) පොදු දේපළ සුරකිමු
(v) අධ්‍යාපනය සාර්ථක ජීවිතයට මග සලසයි.

(මුළු ලකුණු 14)

03. ඔබගේ පාසලට පැමිණෙන මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින්, එය ගමනාගමන කටයුතුවලට බාධාවකි. මෙම තත්ත්වය පැහැදිලි කරමින් මාර්ගය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය ලේකම්තුමාට ලිපියක් ලියන්න. ඔබ පාසල් සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න.

හෝ

ඔබගේ පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයට පැමිණෙන ලෙස දන්වා දෙමාපියන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. (ල. 10)

04. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) සිංහල භාෂාවේ සඤ්ඤක අක්ෂරවල වැඩි වශයෙන් භාවිතයේ නොයෙදෙන අක්ෂරය කුමක් ද?

(ii) පහත සඳහන් පද යොදා නිවැරදිව, අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

අ. කඳ ආ. කඳු

(iii) පහත සඳහන් වාක්‍ය නිදොස් කර ලියන්න.

අ. ගුවන් නියමුවා සේවය අතහැර ගියහ.

ආ. ගුරුතුමිය සිසුහු රැගෙන අධ්‍යාපනය චාරිකාවට සහභාගී වූවාය.

(iv) පහත සඳහන් පදවලට ගැළපෙන ස්ත්‍රී ලිංග පද දෙකක් ලියන්න.

අ. මීයා ආ. මැතිතුමා

(v) පහත සඳහන් පද යොදා වාක්‍ය දෙකක් නිර්මාණ කරන්න.

අ. නුඹ ආ. ඔවුහු (ලකුණු 2×5=10)

05. පහත සඳහන් ප්‍රශ්නවලට පෙළපොත ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(i) ශ්‍රී පාදයේ මහ ගිරි දඹේ ගල්පඩි කප්පවා දම්වැල් සවි කළ රජතුමා කවුරුන් ද?

(ii) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අවම කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(iii) හෝර්ටන් තැන්නේ අලංකාරය පොහොසත් බව මතුවන සාධක දෙකක් ලියන්න.

(iv) සිනා කුමරි පද්‍ය පන්තිය උපුටා ගත් කෘතිය කුමක් ද?

(v) "ලෝහයෙන් තැනූ ගොඩනැගිල්ල" යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 2×5=10)

06. පහත සඳහන් ප්‍රකාශ කා විසින් කාහට ලියන ලද්දක් දැයි ලියන්න.

(i) "එහෙත් ඔබටත් වරදින්නට බැරි නැහැ"

(ii) "ආ.... මට ඒක කියලා දෙන්න බැරි වුණා."

(iii) "අන්න ! කවුද ළමයෙක් නැතිවෙලා ලු."

(iv) "ඊට තොප වික්ෂේප නොව;

(v) "ඔව්, ගිහින් වරෙන්, නැත්නම් කුමාරිහාමිලා තරහා වෙයි." (ලකුණු 2×5=10)

07. පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වැලිතල අතරේ හිමිහිට බසිනා
නේරංජන නදියේ ගයා හිස
වැඩ සිට බුදුවුණ දා තිලෝ හිමි
මොක් සුව ලද මොහොතේ
සමාධි භාවනා

හිමකඳු වැටියේ සීතල සෙවණේ
චන්දන තුරු පීරා හැපී එන
මල්මුව රද රසිනේ
සුවඳ මුසු කෝමල මඳ පවනේ
ගැටීලා පාවෙනා

සත්සර නගලා ටික ටික සෙලවී
සිරිමා බෝ හිමිගේ මනෝහර
පලුපත් අතු රිකිලි
නටා ගිය කාලයෙ රස නැගුණා
සරාගී ජීවනා

සඟමිත් මෙහෙණී දකුණේ ශාඛා
සිරිලක ගෙන ආදා සිට ම තව
මහමෙව්නා උයනේ
නටයි කොළ වන්නම ලෙස මහබෝ
සුමිහිරි නාදෙනා

(i) මෙම ගීයේ සඳහන් නදියක නම ලියන්න.

(ii) "සුවඳ මුසු කෝමල මඳ පවනේ "යන්නෙහි අර්ථය ලියන්න.

(iii) මෙහි සඳහන් පරිදි ශ්‍රී මහ බෝධිය ලංකාවට වැඩම කළේ කවුරුන් ද?

(iv) ශ්‍රී මහ බෝධිය රෝපණය කර ඇත්තේ කොහේ ද?

(v) මෙම ගීතයෙන් ප්‍රකාශ වන්නේ කුමන ගුණයක් ද? (ලකුණු 2×5=10)